සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/14/SS/2/VIII/3/2023
ඔබේ අංකය / உமது இல / Your No: ..................
දිනය / திகதி / Date: 2024.03.04

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / දිස්ත්‍රික් ලේකම්වරු,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වරුන්

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්

සියළුම නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂවරු /සහකාර සමෘද්ධි අධ්‍යක්ෂවරු

සියළුම සමෘද්ධි කළමණාකරුවන් / ප්‍රවර්ධන නිලධාරින්

සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරින්

**සමෘද්ධි සහනාධාර ලබමින් සිටි අස්වැසුම වැඩසටහන යටතේ තේරී පත් නොවූ පවුල්වල අ.පො.ස. (උසස් පෙළ) අධ්‍යාපනය හදාරන දරුවන් වෙනුවෙන් සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක කිරීම.**

අ.පො.ස (උසස් පෙළ) හදාරන දරුවන්ගේ ද්විතීක අධ්‍යාපනයට දිරි දීමක් ලෙස 2023 ජුනි මාසයට අදාලව සමෘද්ධි සහනාධාර ලබමින් සිටි අස්වැසුම වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් නොලැබූ පවුල් සඳහා සමාජ ආරක්ෂණ ක්‍රමවේදය තුලින් ක්‍රියාත්මක කරනු ලබන සිප්දොර ශිෂ්‍යත්ව ප්‍රතිලාභ පමණක් ලබා දීමට 2024.02.21 දිනැති සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර මණ්ඩලය තීරණය කර ඇත. ඒ අනුව එම පවුල්වල 2023 ජුනි මාසය දක්වා ප්‍රතිලාභ ලබාගත් හා ඉදිරි අධ්‍යයන වර්ෂයන්ට අදාලව අ.පො.ස (උසස් පෙළ) හදාරන දරුවන් සඳහා මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට නියමිත වේ.

02. සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල යටතේ "සමෘද්ධි සිප්දොර" ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම - 2022/2024 මැයෙන් 2023.03.01 දිනැතිව නිකුත් කරන ලද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛ (සමාජ ආරක්ෂණ) අංක 2023/04 දරන චක්‍රලේඛ උපදෙස් වලට අමතර වශයෙනි.

03. මෙම සමෘද්ධි සහනාධාර ලබමින් සිටි පවුල් වලට ඔවුන්ගේ එකඟතාවය මත ප්‍රජා දායක සමාජ ආරක්ෂණ ක්‍රමවේදය සඳහා දායක වීම තුලින් අනෙකුත් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභයන්ට ද හිමිකම් ලැබීමට අවස්ථාව ලැබෙනු ඇත.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

04. මේ යටතේ පහත අධ්‍යයන වර්ෂ දෙකට අයත් අ.පො.ස (උසස් පෙළ) හදාරමින් සිටින දරුවන් වෙත මෙම ප්‍රතිලාභ හිමි වනු ඇත.

- 2022/2024 අධ්‍යයන වර්ෂය (2023 පෙබරවාරි සිට 2025 ජනවාරි දක්වා වාරික 24 ක්)
- 2023/2025 අධ්‍යයන වර්ෂය (2024 පෙබරවාරි සිට 2026 ජනවාරි දක්වා වාරික 24 ක්)

05. 2023 ජුනි මාසය දක්වා සමෘද්ධි සහනාධාර වැඩසටහන සහ ඊට සමගාමීව සමාජ ආරක්ෂණ ක්‍රමවේද ක්‍රියාත්මක කරන ලදී. මෙම සමෘද්ධි සහනාධාරලාභින්ගෙන් ලක්ෂ 9 කට ආසන්න පවුල් ප්‍රමාණයක් අස්වැසුම ප්‍රතිලාභ ගෙවීම් ක්‍රමවේදය හරහා ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබා ඇත. ඒ අනුව අස්වැසුම ප්‍රතිලාභ ක්‍රමවේදයට සුදුසුකම් නොලබන ලද පවුල් වෙත පහත පරිදි මෙම සිප්දොර ශිෂ්‍යාත්ව ප්‍රතිලාභ හිමිවනු ඇත.

2022/2024 අධ්‍යයන වර්ෂය (2023 පෙබරවාරි සිට 2025 ජනවාරි දක්වා වාරික 24 ක්)

1- අස්වැසුම ප්‍රතිලාභ ක්‍රමවේදය තුල අභියාචනා හා විරෝධතා සමාලෝචනය සිදුකරන තෙක් 2023 ජූලි සිට දෙසැම්බර් දක්වා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා සමෘද්ධි සහනාධාර ලබා දුන් ප්‍රතිලාභී පවුල් 363,385 කට සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ 2023 නොවැම්බර් දක්වා ලබා දෙන ලදී. ඒ අනුව එම පවුල් වල අ.පො.ස (උසස් පෙළ) හදාරන දරුවන් වෙත 2023 දෙසැම්බර් මාසයට අදාලව සිප්දොර ශිෂ්‍යාත්ව හිඟ වාරික මුදල් ගෙවිය යුතු වේ.

2- ඉහත සමාලෝචනයට ලක් කරන ලද ප්‍රතිලාභී පවුල් අතුරින් අභියාචනා සැලකිල්ලට ගනිමින් අස්වැසුම වැඩසටහනට තේරී පත් වූ ප්‍රතිලාභි පවුල් හැර ඉතිරි පවුල් වල අ.පො.ස (උසස් පෙළ) හදාරන දරුවන් සඳහා ද 2024 ජනවාරි සිට මාර්තු දක්වා සිප්දොර ශිෂ්‍යාත්ව හිඟ වාරික මුදල් ගෙවිය යුතු වේ.

3- 2023 ජුනි දක්වා සමෘද්ධි සහනාධාර ලබමින් සිට අස්වැසුම හෝ සමෘද්ධි හෝ ප්‍රතිලාභයක් නොලැබූ, පවුල්වල අ.පො.ස (උසස් පෙළ) හදාරන දරුවන් සඳහා 2023 ජූලි මස සිට 2024 මාර්තු දක්වා සිප්දොර ශිෂ්‍යාත්ව හිඟ වාරික මුදල් ගෙවීම සිදු කළ යුතුය.

4- ඒ අනුව, 2022/2024 අධ්‍යයන වර්ෂයට අදාල ශිෂ්‍යාත්ව ලාභීන්ගේ තොරතුරු ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිතව ගෙන්වාගෙන ආකෘති- 01 අනුව සාරාංශ වාර්තා වෙන වෙනම සකස් කර දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ අනුමැතිය ඇතිව 2024.03.31 දිනට ප්‍රථම ප්‍රධාන කාර්යාලයේ සමාජ ආරක්ෂණ හා සුභසාධන අංශය වෙත ssfsamurdhi@yahoo.com ඊමේල් ලිපිනය ඔස්සේ එවිය යුතුය.

06. 2023/2025 අධ්‍යයන වර්ෂය (2024 පෙබරවාරි සිට 2026 ජනවාරි දක්වා) -2023 ජුනි මාසයට අදාලව සමෘද්ධි සහනාධාර ලබමින් සිටි අස්වැසුම ප්‍රතිලාභ නොලබන පවුල්වල අ.පො.ස (උසස් පෙළ) හදාරන දරුවන් සිප්දොර ශිෂ්‍යාත්ව වැඩසටහන සඳහා ඇතුළත් කිරීම සිදුකළ යුතුවේ. ඒ සඳහා 2023.03.31 දිනැතිව නිකුත් කරන ලද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛ (සමාජ ආරක්ෂණ) අංක 2023/04 දරන චක්‍රලේඛ උපදෙස් අනුගමනය කරමින් කටයුතු සිදු කල යුතුවේ.

07. එම අධ්‍යයන වර්ෂයට අයත් අධ්‍යයන කටයුතු 2024 පෙබරවාරි මස ආරම්භ කර ඇති බැවින් 2024 පෙබරවාරි හා මාර්තු මාසයන්ට අදාලව සිප්දොර ශිෂ්‍යත්ව හිඟ වාරික ගෙවීම සිදු කල යුතුය. ඒ අනුව අදාල ශිෂ්‍යත්ව ලාභීන්ගේ තොරතුරු ආකෘතිය -02 මගින් දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ අනුමැතිය ඇතිව 2024.03.31 දිනට ප්‍රථම ප්‍රධාන කාර්යාලයේ සමාජ ආරක්ෂණ හා සුභසාධන අංශය වෙත ssfsamurdhi@yahoo.com ඊමේල් ලිපිනය ඔස්සේ එවිය යුතුය.

08. අනතුරුව එම වාර්තා පදනම් කරගෙන අදාල හිඟ වාරික මුදල් ගෙවීමට හා මාසික වාරික මුදල් ගෙවීම් සඳහා අත්තිකාරම් මුදල් සමාජ සංවර්ධන භාරකාර අරමුදලින් දිස්ත්‍රික් කාර්යාල වෙත පෙර පරිදි නිදහස් කරනු ලබන අතර, දිස්ත්‍රික් කාර්යාල වලින් අදාල ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත අවශ්‍ය මුදල් නිදහස් කිරිමට කටයුතු කරනු ලැබේ.

09. මීට පෙර පැවති සමාජ ආරකෂණ වැඩසටහනේ පරිදි සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහනට අදාල ආකෘති - 03 අනුව මාසිකව සකස් කර එවනු ලබන වාර්තා සමඟ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ අත්සනින් යුතුව ප්‍රතිපූර්ණය සඳහා ඉදිරිපත් කල යුතුය.

10. සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ මාර්ගස්ථ ක්‍රමවේද හරහා ගෙවීම් සිදු කල නියමු ව්‍යාපෘතිය අවසන්ව ඇති බැවින් එම බැංකු 25 ට අදාල තොරතුරුද ඉහත වාර්තාවන්ට ඇතුලත් කර එවිය යුතුය.

11. මෙම සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරිමේ දී 2023.03.01 දිනැතිව නිකුත් කරන ලද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛ (සමාජ ආරක්ෂණ) අංක 2023/04 දරන චක්‍රලේඛයේ අනෙකුත් උපදෙස් තවදුරටත් අදාල කරගන්නා ලෙස කාරුණිකව දන්වමි.

12. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට පැවරී ඇති අස්වැසුම ප්‍රතිලාභීන් සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ අස්වැසුම ප්‍රතිලාභී පවුල් හා අස්වැසුමට තේරී පත් නොවූ සමෘද්ධිලාභීන්ව සිටි පවුල් වල එකඟතාවය මත සමාජ සංවර්ධන භාරකාර අරමුදලට දායක කර ගනිමින් ප්‍රජාදායක සමාජ ආරක්ෂණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේ කටයුතු සැලසුම් කර ඇති බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

සී.ඩී. කළුආරච්චි
සභාපති - සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල් -සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

පිටපත්

1. ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. ප්‍රධාන අභ්‍යන්තර විගණක - අ.ක.ස./ දැ.ගැස